**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
Saliya Galappaththie
0422 671 826
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name**
**- Sannasa Media**
Bank - Cmmonwealth
BSB - 063619
Acc - 10852409

**සන්නස පිරිවර**
චාමර ලක්ෂාන්
ආරියනන්ද දොඹගහවත්ත
සාලිය ගලප්පත්ති
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්4ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

## වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා



# මහින්ද, රනිල් සහ මහ චිත්‍රය

**සරත් ද අල්විස්**

අතුරු කතාවක එල්ලීමෙන් මහ කතාව මගහැරෙන බවට පැරණි චීන කතාවක් තිබේ. මේ ලිපිය ඒ මහ කතාව ගැන ය.

මහින්ද රාජපක්ෂ පිළිබඳ සංසිද්ධිය අපට පමණක් විශේෂිත නැත. මානව ඉතිහාසය තුළ මෙවැනි කොතෙකුත් මිනිස්සු උන්හ. ප්‍රංශ දේශපාලනික දාර්ශනික එතියන් දෙ ලා බොඑතී සිය ජීවිත කාලයම ගතකොට ඇත්තේ, මහින්ද රාජපක්ෂ පන්නයේ ප්‍රජා පීඩකයන් පිළිබඳ අධ්‍යයනයන් සඳහා ය. මෙවැනි ප්‍රජා පීඩකයන්ගේ විශේෂත්වය වන්නේ, ඔවුන් ප්‍රජා පීඩනයේ යෙදෙන්නේ, ප්‍රජාවගේ කැමැත්තෙන්ම වීමයි. ඒ අරභයා, ඉහත කී ප්‍රංශ දේශපාලනික දාර්ශනිකයා, "අවනත භාවයේ දේශපාලනය - ස්වේච්ඡා දාස භාවය පිළිබඳ කතිකාව" මැයෙන් අග්‍රගන්‍ය කෘතියක් සම්පාදනය කෙළේය.

ජී. ඇල්. පීරිස්, ඩලස් අලහප්පෙරුම, උදය ගම්මන්පිල හෝ දිනේෂ් ගුණවර්ධන කියන දේවල් ටිකක් අහන්න. මේ අය, "රත්තරං" රෝහිත හෝ "එතනෝල්" අරුන්දික වැනි මැරවර තක්කඩියන්ගෙන් වෙනස් ය. ඔවුන්, සෑහෙන අධ්‍යාපනයක් සහ යම් පරිචයක් සහිත පිරිසකි. 1550 දී මේ ගැන ලියන ඉහත කී ප්‍රංශ දාර්ශනිකයා ඔවුන්ගේ පරපුටු සනුහරය ගැන මෙසේ විස්තර කරයි.

**"ප්‍රජා පීඩකයන් රටවැසියන්ව යටත් කරගෙන සිටින අතර ඔහු ඉන් සමහරෙකු යටත් කරගන්නේ තවත් අය මාර්ගයෙනි. මේ ආකාරයට, යමෙකු විනීත මිනිසෙකු වීම නිසා යම් විටෙක තමාට තර්ජනයක් වීමට ඇති ඉඩකඩ, මේ ප්‍රජා පීඩකයා මගහරවා ගන්නේ එම විනීත මිනිසුන් මාර්ගයෙන්මයි. එය හරියට, ලී කොටයක් පලා ගැනීමට ලී කූඤ්ඤයක්ම පාවිච්චි කරන්නාක් මෙනි. ඔහුගේ දුනුවායෝ ඔවුහු ය. ඔහුගේ රැකවල්ලු ඔවුහු ය. ඔහුගේ පොරෝ*භටයෝ ඔවුහු ය. ඔවුනුත් මේ ප්‍රජා පීඩකයාගෙන් ඉඳහිට නොවිඳවනවා නොවේ. එහෙත්, දෙවියන් විසින් සේම මනුෂ්‍යයන් විසින් ද අත්හරින ලද මෙවැනි රොඩ්ඩු, නපුර යෙදවෙන්නේ තමන්ට එරෙහිව නොව, තමන් සේම ඊට අවනත වන සහ කිසිවක් කරකියාගත හැකි දෙයක් නැති වෙනත් අයට එරෙහිව නම්, ඒ නපුර ඉවසා දරා සිටීමට නම්මවා ගත හැකිය"**

ඒ කාලයේ මකියාවෙල්ලිගේ නරුම යථාර්ථවාදය සේම, සමහර විට අපේ කාලයේ ආචාර්ය දයාන් ජයතිලක වැන්නන්වත් ප්‍රශ්න කරන ප්‍රංශ දාර්ශනිකයා, අපේ අසමත් වූ හෝ අසමත් වෙන ගානට වැටී ඇති යහපාලන චාරිකාවට මගහැරී ඇති නෛතික පරමාදර්ශවාදයේ ලුණු ඇඹුල අපට කියාදෙයි.

සාමාන්‍යයෙන් මිනිසුන් කැමැත්තක් දක්වන්නේ සාධාරණ අන්දමින් පාලනය වීමට ය. තනි මිනිසෙකු හෝ ඔහුගේ සහෝදරයන් හෝ පවුල් සාමාජිකයන් විසින් හිතුමතේට පාලනය වනු ලැබීමට මිනිසුන්ගේ කැමැත්තක් නැත. එහෙත් විටෙක යුද්ධයක් නිසා ඇති විය හැකි අස්ථාවර භාවයන් හේතුකොටගෙන, එවැනි ආපදාවක් ජය ගැනීමට හැකියාවක් ඇතැයි තමන් විශ්වාස කරන තනි මිනිසෙකුගේ නායකත්වයක් ඔවුන් අපේක්ෂා කළ හැකිය. ඊළඟ ප්‍රශ්නය පැන නගින්නේ එම පුද්ගලයාගෙන් නිදහස් වීමට යාමේදී ය. ඊශ්‍රායල් වැසියෝ

**කලිගියුලා නැමැති රෝම අධිරාජයා, ඉන්කිටාටුස් නැමැති සිය අශ්වයාව රාජ*ධූතයෙකු බවට පත්කළේය. කලිගියුලාට පිස්සු යැයි ඇතැම්හු සිතූහ. නැත, ඔහුට තිබුණු පිස්සුවක් නැත. අශ්වයාව එම තනතුරට පත්කිරීමෙන් ඔහු කෙළේ, සෙනේට් සභාවට දේශපාලනික නිවේදනයක් නිකුත් කිරීමයි. තමා ආශා කරන ඕනෑම දෙයක් තමාට කළ හැකි බව, එම නිවේදනය තුළ අඩංගු පණිවිඩයයි.**

සාවුල්ව තෝරා ගත්හ. අපි මහින්ද රාජපක්ෂව තෝරා ගත්තෙමු.

මෙවැනි යුද කාලීන හදිසි තත්වයන් යටතේ ජනතාවක් විසින් ඒකාධිපතියන් සේ තෝරා පත්කර ගන්නා ඇතැම් පුද්ගලයන්ට, ජනතාව කෙරෙහි වන තම බලය සනාතන කර ගැනීමට ලැබෙන අවස්ථාව තුළ, රැවටිල්ලත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මහා කොල්ලයත් බිහි වන්නේය. පීල්ලට වැටුණු සැණින් යකඩ යකා ඉදිරියට ඇදෙයි. ජන*තන්ත්‍රය මියැදෙයි. සියල්ල ස්වාමියාට අයත් වෙයි. කලිගියුලා නැමැති රෝම අධිරාජයා, ඉන්කිටාටුස් නැමැති සිය අශ්වයාව රාජ*ධූතයෙකු බවට පත්කළේය. කලිගියුලාට පිස්සු යැයි ඇතැම්හු සිතූහ. නැත, ඔහුට තිබුණු පිස්සුවක් නැත. අශ්වයාව එම තනතුරට පත්කිරීමෙන් ඔහු

8 වන පිටට

